ඉගෙන ගනිමින් වැඩ කරමු.

වැඩ කරමින් ඉගෙන ගනිමු.

10වන හා 12වන ශ්‍රේණියේ

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය**

විෂයය උගන්නා දරුවන් සඳහා වූ

# මාධ්‍ය වැඩ හුරුව අධ්‍යාපන සතිය

# Media Work Experience Education Week

for grade 10 & 12

Communication & Media Studies Students

උපදෙස් සංග්‍රහය

Instructional Manual

(පාසලේ අභිමතය පරිදි දිනයන් වෙනස් කර ගත හැකි ය.)

අධ්‍යාපන අමාත්‍යංශයේ, විෂය සමගාමී අංශය හා
ජාතික අධ්‍යාපන ආයතනයේ මාධ්‍ය අධ්‍යාපන ව්‍යාපෘතිය විසින්
සැලසුම් කරන ලද ඒකාබද්ධ වැඩ සටහනකි.

A Joint Program of the Media Education Project of NIE &
the C0-Curricular Branch of MOE

මාධ්‍ය අධ්‍යාපන ව්‍යාපෘතිය 2010.07.08

විදුහල්පති,
.........................................

**මාධ්‍ය වැඩ හුරුව අධ්‍යාපන සතිය වැඩ සටහන - 2010**

2010 වර්ෂයේ දී මාධ්‍ය වැඩ හුරුව අධ්‍යාපන සතිය වැඩ සටහන පැවැත්වීමට අදාළ අත්පොත මේ සමග එවා ඇත. මෙම වැඩ සටහන සංවිධානය කිරීම සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය භාර ගුරු භවතා වෙත නිසි පරිදි පැවරීම අවශ්‍ය ය.

10 වන ශ්‍රේණියේ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හදාරන දරු දැරියන් පාසල ආසන්නයේ ඇති ඕනෑම කාර්යාලයකට ද, පසු ගිය වර්ෂයේ 12 වන ශ්‍රේණියේ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හැදෑරීම ආරම්භ කරන ලද දරු දැරියන් පාසල ආසන්නයේ ඇති සමෘද්ධි කාර්යාලයකට / සමෘද්ධි බැංකුවකට ද සතියක කාලයකට අනුයුක්ත කිරීම මෙම වැඩ සටහන යටතේ අපේක්ෂා කෙරේ.

මෙම වැඩ සටහනට සහභාගි වීම හෝ නොවීම අදාළ දරු දැරියන්ගේ හා එම දෙමාපියන්ගේ අභිමතය පරිදි සිදු විය යුතුය. මේ සඳහා අත්පොතේ දැක්වෙන පරිදි දරුවන්ගේ හා දෙමාපියන්ගේ කැමැත්ත ලිඛිතව ලබා ගත යුතු අතර, සැලැස්ම සකස් කර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා වෙත ලිඛිතව ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුය.

පාසලේ අවශ්‍යතාව පරිදි මෙම වැඩ සටහන පැවැත්වෙන දිනයන් වෙනස් කර ගත හැකි බව අවධාරණය කරනු කැමැත්තෙමි.

වැඩ සටහනට සහභාගි වන දරුවන්ගේ දෛනික සටහන් තබා ගැනීමට සකස් කරන ලද වැඩ හුරුව දින පොත ජාතික අධ්‍යාපන ආයතනයේ නිල වෙබ් අඩවියෙන් (www.nie.lk) ලබා ගත හැකි අතර, එහි අවශ්‍ය පිටපත් දරුවන්ගේ සහයෝගයෙන් සකස් කර ගැනීමට කටයුතු කරන්න.

වැඩ සටහන නිම වීමෙන් සතියක තුළ ඒ පිළිබඳ වාර්තාවක් මා වෙත ලැබෙන්නට සලස්වන්න.

විමල් සියඹලාගොඩ
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
(විෂය මාලා සංවර්ධන)
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

පිටපත්:
අධ්‍යාපන අධ්‍යක්ෂ (විෂය සමගාමී, උපදේශන හා මාර්ගෝපදේශන)අධ්‍යාපන අමාත්‍යාංශය
සියලු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත
සියලු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත
විමසීම් සඳහා 072 39 19 754 (ප.ව.3.00 සිට 5.00 දක්වා ) යොදා ගන්න

**Media Work Experience Education Week**

**Board of Advisors**
Dr.Upali M.Sedera, DG, NIE
Mr.Wimal Siyambalagoda, ADG, NIE
Mr. D.D.Nandasiri, DD, MOE

**Managing**
Mr.Bandula P.Dayarathne, Leader, MEP, NIE

**Contacts:**
Director General, National Institute of Education, Maharagama, Sri Lanka
Tel: 0094 - 11 - 7601694 / 7601621 / 072 - 3919754
Fax: 0094 - 011 - 7601800

## මාධ්‍ය වැඩ හුරුව අධ්‍යාපන සතිය

හැඳින්වීම

වැඩ හුරුව යනු නව යෞවනයන් ගේ අධ්‍යාපනයේ වැදගත් අංගයකි. අධ්‍යාපනය තුළ දැනුම රැස් කිරීමට මුල් තැන ලැබීම නිසා වැඩ හුරුව යන්න අත් හැර දමනු ලැබූ අංගයක් බවට පසු කාලයේ දී පත් විය. 60 දශකයේ දී ශ්‍රී ලංකාව තුළ වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ ජාතික වැඩ සටහනක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද අතර, එහි දී වැඩ හුරුව සංකල්පය කෙරෙහි යළිත් අවධානය යොමු විය. ඒ පිළිබඳ පුළුල් වැඩ සටහනක් ද කෙටි කාලයක් තුළ ක්‍රියාත්මක කරනු ලැබීය. 60 දශකයේ අග භාගයේ දී නැවත වරක් මේ පිළිබඳ අවධානය යොමු වූ අතර, පාසල් සිසුන් පුළුල් වශයෙන් වැඩ හුරුව සඳහා යොමු කරන වැඩ සටහනක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලදී. ඒ අනුව පාසල්වල දරුවන්ට පාසලින් පිටතට විත් තම ප්‍රදේශයේ විවිධ ආර්ථික හා සමාජීය ක්‍රියාකාරකම් සමග එක් වෙමින් සැබෑ වැඩ අත්දැකීමක් ලබා ගැනීමට අවකාශ සැලසිණි. මෙය ඉතා සාර්ථක හා ජනප්‍රිය වූ වැඩ සටහනක් බවට පත් වූයේය. පාසල් දරුවන් ද ගුරු භවතුන් ද ඉතා උනන්දුවෙන් මේ සඳහා දායක වූ අතර, දෙමාපියන්ගේ සහයෝගය ද උපරිම ව ලැබිණි.

පාසල් දරු දැරියන්ට වැඩ ලෝකය පිළිබඳ අත්දැකීමක් ලබා දීමට හොඳම වකවානුව කුමක්ද? යන්න පිළිබඳ නිගමනයකට එළඹිය යුත්තේ අධ්‍යාපන මනෝ විද්‍යාඥයන්ගේ පර්යේෂණයන් මගිනි. එවැනි පර්යේෂණ වැඩ සටහන් විශේෂයෙන් බ්‍රිතාන්‍යය, ඇමෙරිකා එක්සත් ජනපදය, කැනඩාව හා නවසීලන්තය යන රටවල ඉතා විශිෂ්ට පවත්වා ඇත. ඒවායින් අනාවරණය වී ඇත්තේ වැඩ ලෝකයේ ස්වභාවය පිළිබඳ සැබෑ අත්දැකීමක් ලබා ගත හැකි ආකාරයේ වැඩ හුරුව වැඩ සටහනකට දරුවන් සම්බන්ධ කළ යුත්තේ වයස අවුරුදු 15න් ඉහළ වයසේ දී බවය. ශ්‍රී ලංකාවේ භාවිතය අනුව ඒ සඳහා යෝග්‍ය වන්නේ 10 වන ශ්‍රේණියේ හා 12 වන ශ්‍රේණියේ දරුවන්ය. මේ අනුව එම ශ්‍රේණිවල සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය උගන්නා දරුවන්ට මාධ්‍ය වැඩ හුරුව ලබා දීම එම විෂයයේ ඉගෙනුම් වැඩ සටහනේ කොටසක් ලෙස සැලසුම් කරනු ලැබ ඇත. ඒ මගින් ඔවුන්ට තමන් ඉගෙන ගන්නා විෂයයට අයත් වැඩ ලෝකය පිළිබඳ සැබෑ අත්දැකීමක් විඳ ගන්නට අවකාශය සැලසේ.

වැඩ හුරුව යනු කිසිසේත් අධ්‍යාපන ක්‍රියාවලියෙන් බැහැර වූවක් නොවේ. එය නිශ්චිතවම අධ්‍යාපන ක්‍රියාවලිය සමග බැඳී පවතී. වැඩ ලෝකය පිළිබඳව පන්ති කාමරය තුළ කොතරම් කියා දුන්නත්, වඩාත් ශක්තිමත් වන්නේ අත් විඳීමෙන් ලබා ගන්නා ඉගෙනුමයි. ඒ මගින් දරුවන්ට ලබා ගත හැකි ප්‍රතිලාභ බොහෝය. ඒවා සංක්ෂිප්ත වශයෙන් මෙසේ දැක්විය හැකිය.

1. වැඩ කරන ස්ථානවල සැබෑ ස්වභාවය විඳ ගැනීම
2. වැඩ කරන ස්ථානවල ශ්‍රමිකයන්ගෙන් අපේක්ෂා කරන මූලික නිපුණතා ගවේෂණය
3. වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ මාර්ගෝපදේශයක් ලබා ගැනීම
4. වැඩ කරන ස්ථානවල දී ශ්‍රමිකයන් කටයුතු කරන ආකාරය පිළිබඳ අත්දැකීමක් ලබා ගැනීම
5. වැඩ කරන ස්ථානවල සංවිධාන ව්‍යුහය, සන්නිවේදන රටා හා පරිපාලනය පිළිබඳ විමසීම
6. වැඩ ලෝකය පිළිබඳ යහපත් ආකල්ප පෝෂණය
7. වැඩ බිම්වල පවත්නා වැඩ සංස්කෘතිය ඊ ළඟ පරම්පරාවට සම්ප්‍රේෂණය
8. අනාගත ආර්ථික සංවර්ධනයට තරුණ පිරිස සූදානම් කිරීම
9. තමන්ගේ හැකියා හා දුර්වලතා පිළිබඳ සිතන්නට අවකාශ සැලසීම
10. තමන්ගේ අනාගත රැකියා ජීවිතය පිළිබඳව සිතන්නට අවකාශ සැලසීම

මෙම ප්‍රතිලාභ දරුවාට නිසි ලෙස ප්‍රයෝජනවත් වන්නේ, ඒවා ඒකරාශි කිරීම තුළින් තමන්ගේ වෘත්තීය ජීවිතය පිළිබඳව අලුතින් සිතන්නට හා එය සැලසුම් කිරීමේ යම් යම් දිශාවන් පිළිබඳව අවධානය යොමු කරන්නට ඉඩ ලැබීමෙනි. මෙයින් අදහස් කරන්නේ දරුවන් පාසලේ ඉගෙනීම අත් හැර දමා රැකියාවකට යොමු කරන බව නොවේ. එහෙත් ඉදිරි දිනයක තමන්ගේ රැකියාව හෝ වෘත්තිය හෝ තෝරා ගැනීමේ දී ඒ පිළිබඳව නිසි අවබෝධයකින් හා ප්‍රමාණවත් නිපුණතාවකින් කටයුතු කරන්නට දරුවන්ට මේ නිසා අවකාශය සැලසේ.

වැඩ හුරුව අධ්‍යාපන සතියේ දී සිදු වන්නේ ඒ සඳහා තෝරා ගත් හා කැමති වූ දරුවන් පාසල ආසන්නයේ ඇති රජයේ කාර්යාලයකට හෝ සංවර්ධන ව්‍යාපෘතියකට හෝ සතියක කාලයකට අනුයුක්ත කිරීමයි. එවිට එහි සාමාන්‍ය ශ්‍රමිකයන් සේවය කරන ආකාරයටම එම ස්ථානයට සේවය සඳහා ගොස්, එහි කටයුතුවලට සැබෑ ලෙසම සම්බන්ධව කටයුතු කරන්නට දරුවන්ට අවකාශය සැලසේ. එහි දී තමන්ගේ දින පතා කටයුතු සියල්ල නිසි ලෙස වාර්තා කිරීම හා සතිය අවසානයේ සමස්ත වාර්තාවක් සකස් කර ඉදිරිපත් කිරීම දරුවන්ගේ වගකීමකි. එය දරුවන්ගේ ජීවිත සඵල කිරීම සඳහා යොදා ගන්නා ඵලදායී ඉගෙනුම් කාර්යයකි.

## විෂය සමගාමී ක්‍රියාකාරකම් දරුවන්ගේ සංවර්ධනයට අත්‍යවශ්‍යයි.

පාසල් අධ්‍යාපනය ප්‍රධාන වශයෙන් අංග දෙකකින් සමන්විත වේ. එකක් නම් විෂයාත්මක ඉගෙනුමයි. ඒ සඳහා විවිධ විෂයයන් සැලසුම් කර ඇති අතර, ඒවා ඉගෙන ගන්නට දරුවන්ට පන්ති කාමරය තුළ දී අවකාශය සැලසේ. විෂයයන්ට අදාළ කරුණු ඉගෙනීමෙන් පමණක් දරුවකුගේ අධ්‍යාපනය සාර්ථක නොවේ. ඒ සඳහා විවිධ විෂය සමගාමී ක්‍රියාකාරකම්වල දරුවන් යෙදවිය යුතුය. මුල් කාලයේ දී මෙය හඳුන්වන ලද්දේ විෂය බාහිර ක්‍රියාකාරකම් යනුවෙනි. එහෙත් අධ්‍යාපනඥයන් විසින් අනාවරණය කර ගෙන ඇති පරිදි, දරුවකු පාසලට බද්ධව කරනු ලබන විවිධ ක්‍රියාකාරකම් විෂය බාහිර ඒවා නොව විෂය සමගාමී ඒවා බව අද පිළි ගනී. විෂයානුබද්ධ ඉගෙනුමට සමාන්තරව විෂය සමගාමී ක්‍රියාකාරකම්වල ප්‍රමාණවත් පරිදි යෙදීමෙන් දරුවකුගේ පූර්ණ ස්වීයත්වය ඇති වන බව අද පිළි ගැනේ.

පාසල් තුළ දී කරනු ලබන විවිධ විෂය සමගාමී ක්‍රියාකාරකම්වල පදනම වන්නේ ශිෂ්‍ය සමිතියයි. තමන්ගේ අභිමතය පරිදි හෝ පාසලේ අභිමතය පරිදි හෝ දරුවන්ට විවිධ ශිෂ්‍ය සමිතිවලට සහභාගී වී විවිධ ක්‍රියාකාරකම්වල යෙදිය හැකිය. ඒවා සැලසුම් කළ හැකිය. ඒවා ක්‍රියාත්මක කළ හැකිය. එසේම තමන් කළ දේ හරියට කළා දැයි තක්සේරු කළ හැකිය. ඒ සියල්ල ඉගෙනුම් ක්‍රියාකාරකම් වේ. ඒ හැර පාසල විසින් සංවිධානය කරනු ලබන පාසලින් බැහැරව ක්‍රියාත්මක වන විවිධ විෂය සමගාමී ක්‍රියාකාරකම්වලට සහභාගි වන්නට ද දරුවන්ට අවස්ථාව සැලසේ. එයින් වඩාත් ජනප්‍රිය අංගය ලෙස සැලකෙන්නේ අධ්‍යාපන චාරිකාවන්ය.

10 හා 12 වන ශ්‍රේණියේ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හදාරන සිසු දරු දැරියන් සඳහා සංවිධානය කරනු ලබන මාධ්‍ය වැඩ හුරුව අධ්‍යාපන සතිය මෙම විෂය සමගාමී ක්‍රියාකාරකම් අතර සුවිශේෂ තැනක් ගනී. එයට ශිෂ්‍ය සමිතියක් නැත. එය චාරිකාවක් ද නොවේ. එය පූර්ණකාලීනව දින පහක කාලය තුළ පන්ති කාමරයෙන් බැහැරව වැඩ අත්දැකීමක් ලබා ගැනීමේ වැඩ සටහනකි. අප රටට මෙය අලුත් අත්දැකීමක් වුවත් ලොව බොහෝ දියුණු රටවල පාසල්වල අධ්‍යාපනයේ කොටසක් ලෙස වැඩ හුරුව වැඩ සටහන් ක්‍රියාත්මක වේ. ඒ අනුව අප විසින් මේ කරනු ලබන්නේ අපගේ අධ්‍යාපන පද්ධතියට අලුත් වැඩ සටහනක් යොදා ගැනීමයි.

අපගේ පෙර අත්දැකීම් අනුව පෙනී යන කරුණක් නම්, අලුත් වැඩ සටහනක් අධ්‍යාපන පද්ධතියට හඳුන්වා දීම පහසු කටයුත්තක් නොවන බවයි. එවැනි අලුත් වැඩ සටහන් සම්බන්ධයෙන් ක්‍රියාකාරී මට්ටමේ දී විවිධ අභියෝග හා ගැටළු පැන නැගීම එයට හේතුවයි. මූලික වශයෙන් අලුත් වැඩ සටහන කෙරෙහි සැක මුසුව බැලීමේ පුරුද්දක් බොහෝ දෙනා සතුය. එම සැකය ඉවත් කළ හැක්කේ එහි සැබෑ අරමුණු පැහැදිලිව ඉදිරිපත් කිරීමෙනි. දෙවනුව මෙවැනි අලුත් කාර්යයක් පාසලකට අලුත් බරක් එක් කරනු ලබන බව පාසලට සම්බන්ධ බොහෝ පාර්ශ්වයෝ කල්පනා කරති. එය සත්‍යයකි. අලුත් වැඩක් සඳහා කාලය වෙන් කළ යුතුය. එය සැලසුම් කළ යුතුය. එය සංවිධානය කළ යුතුය. ක්‍රියාත්මක කළ යුතුය. ඒ සඳහා භෞතික සම්පත් මෙන්ම මානව සම්පත්ද අවශ්‍ය වේ. තුන් වෙනුව මෙවැනි අතිරේක වැඩ සටහන්වල යෙදීම අධ්‍යාපනයට බාධාවක් බව දෙමාපියන් මෙන්ම දරුවන්ද කල්පනා කරන්නට පුලුවන. සමහර සාධක අනුව බැලූ විට මෙය සත්‍යයක් සේ පෙනුනත්, සත්‍යයක්ම නොවේ.

අප සමස්තයක් වශයෙන් කල්පනා කළ යුත්තේ, අධ්‍යාපනය යනු පොතපත පාඩම් කිරීම හෝ විභාගවලට ලිවීම හා ඒ සඳහා සූදානම් වීම හෝ නොව, ඊට වඩා පුළුල් කාර්යයක් වන බවය. එය ඇත්තෙන්ම දරුවකු අනාගත ජීවිතය සඳහා සූදානම් කරවීමකි. එම අර්ථයෙන් ගත් කළ මාධ්‍ය වැඩ හුරුව අධ්‍යාපන සතිය තුළින් දරුවන් ලබන සැබෑ අත්දැකීම්, ඔවුන් අනාගත ජීවිතය සඳහා සූදානම් කරවීමට අතිශයින් ප්‍රයෝජනවත් වේ.

මාධ්‍ය වැඩ හුරුව අධ්‍යාපන සතිය සම්බන්ධයෙන් විශේෂයෙන් දැක්විය යුත්තක් නම්, එය හුදෙකලා වැඩ සටහනක් නොවන බවයි. එය 10 හා 12 වන ශ්‍රේණි සඳහා වූ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයයේ විෂය සමගාමී ක්‍රියාකාරකමක් වේ. එයින් අපේක්ෂා කරන්නේ විෂයය තුළට උගන්නා දෙයට සමාන්තරව වැඩ ලෝකයේ සන්නිවේදනය හා මාධ්‍ය චර්යාවන් පිළිබඳ සැබෑ අත්දැකීමක් ලබා ගැනීමකි. ඒ මගින් දරුවන්ට තමන් උගත් දෙය සැබෑ වශයෙන් පවතින්නේ කෙසේද? යන්න පිළිබඳව තුලනාත්මක විමර්ශනයක යෙදෙන්නට අවස්ථාව ලැබේ.

මෙම පසුබිම යටතේ මාධ්‍ය වැඩ හුරුව අධ්‍යාපන සතියව වැඩ සටහන පාසල්වල සංවර්ධනය සඳහා සෘජුව යොදා ගත හැකි නව වැඩ සටහනක් බව තහවුරු වේ. මේ සඳහා සහය දැක්වීම පාසල්වල හා අධ්‍යාපන කාර්යාලවල සියලු පාර්ශ්වයන්ගේ වගකීමකි. යුතුකමකි.

මාධ්‍ය වැඩ හුරුව 2007, 2008,2009 වැඩ සටහන්
අතිශයින් සාර්ථකයි.

මාධ්‍ය වැඩ හුරුව අධ්‍යාපන සතිය නියාමක වැඩ සටහන 2007 ඔක්තෝබර් 1 සිට 5 දක්වා වූ සතිය තුළ ද, දෙවන නියාමක වැඩ සටහන 2008 ඔක්තෝබර් 20 සිට 25 දක්වා වූ සතිය තුළ ද, තුන්වන වැඩ සටහන 2009 ජුලි 13 සිට 17 දක්වා වූ සතිය තුළ පවත්වන ලදී. 2007 දී පාසල් 15ක්ද, 2008 දී පාසල් 30ක් ද මේ සඳහා සහභාගි වූ අතර 2009 සහභාගිත්වය පාසල් 100 කට අධික විය. එය ඇත්තෙන්ම විශිෂ්ට අධ්‍යාපනික වැඩ සටහනකි.

දෙවන නියාමක වැඩ සටහනින් පසු කරන ලද ඇගයුම් වැඩ සටහන 2008 පෙබරවාරි 21 වන දින ජාතික අධ්‍යාපන ආයතනයේ දී පවත්වන ලදී. මාධ්‍ය වැඩ හුරුව 2008 නියාමක වැඩ සටහනට සහභාගි වූ දරුවෝද , ගුරු භවත්හුද. දෙමාපියෝද, කාර්යාල නිලධාරීහුද මෙම අවස්ථාවට සහභාගි වූහ. එසේම 2009 වැඩ සටහනේ ඇගයුම් වාර්තා මගින් ද මෙම වැඩ සටහනෙහි සාර්ථකත්වය තක්සේරු කර ඇත. ඒ අනුව පහත සඳහන් තොරතුරු හෙළි වී ඇත.

1. මාධ්‍ය වැඩ හුරුව අධ්‍යාපන වැඩ සටහන එහි ඉලක්කයට ළඟා වී ඇති අතර, එය අතිශයින් සාර්ථක වී ඇත.
2. මාධ්‍ය වැඩ හුරුව අධ්‍යාපන වැඩ සටහන සඳහා දරු දැරියන් සහභාගි කරවීම සම්බන්ධයෙන් දෙමාපියන්ද, එම දරු දැරියන් හා විදුහල්පතිවරුන් ද 10 /12 ශ්‍රේණි සමාන්තර පන්තිවල ගුරු භවතුන්ද බල පා තිබිණි.
3. දෙමාපියන් විසින් මෙම වැඩ සටහන දරුවන් සහභාගි කරවීම ඉතා කැමැත්තෙන් කර ඇත.
4. දෙමාපියන් ඉතා සුළු සංඛ්‍යාවක් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අඩාල වන බව පවසා මාධ්‍ය වැඩ හුරුව අධ්‍යාපන වැඩ සටහනට සිය දරුවන් සහභාගි කරවීමෙන් වැළකී සිට ඇත. (මෙහි අධ්‍යාපන කටයුතු යනුවෙන් ඔවුන් අදහස් කරන්නේ ටියුෂන් පන්තිවලට යාමය.)
5. 10 /12 ශ්‍රේණියේ පන්තිවල අනෙක් ගුරු භවතුන් මේ සම්බන්ධයෙන් දක්වා ඇති පොදු ආකල්පය නම්, පන්තියේ ඉගැන්වීම් කටයුතු කෙරෙන වකවානුව තුළ මේ ආකාරයෙන් ළමුන් කොටසක් පමණක් පන්තියෙන් බැහැර කිරීමෙන් ඔවුන්ට තම පාඩම් අවසාන කරන්නට අවස්ථාව නොලැබෙන බවය.
6. විදුහල්පතිවරුන්/වරියන් මේ සම්බන්ධයෙන් ඉතා යහපත් ආකල්පයකින් කටයුතු කරනු ලැබූ බව වාර්තා විය. අවස්ථා දෙකක දී පමණක් ආරක්ෂක හේතූන් මත දරුවන් පාසලෙන් පිටතට යැවීමට විදුහල්පතීන් එකඟ වී නැත. සමහර පාසල් නියමිත සතියෙන් පසු වෙනත් සතියක මාධ්‍ය වැඩ හුරුව වැඩ සටහන සඳහා ළමුන් සහභාගි කරවා ඇත.
7. මෙම වැඩ සටහනට සම්බන්ධ පාසල් ඇගයුම් වාර්තා අනුව යෝජනා කිහිපයක් ඉදිරිපත් කර ඇත.
(1) 10 හා 12 ශ්‍රේණිවල සියලු දරු දැරියන් මෙම වැඩ සටහනට සහභාගි කරවීම
(2) සතියක කාලයක් වෙනුවට සති දෙකක කාලයක් වැඩ සටහන ක්‍රියාත්මක කිරීම
(3) වැඩ සටහන පිළිබඳව පාසලේ ගුරු මණ්ඩලය හා දෙමාපියන් නිසි ලෙස දැනුවත් කිරීම

8. මාධ්‍ය වැඩ හුරුව අධ්‍යාපන සතිය වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා එයට සම්බන්ධ සියලු කලා අධ්‍යාපන අධ්‍යක්වරුන් හා කොට්ඨාශ භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් ඉහළ මට්ටමේ සහයෝගයක් ලබා දී ඇත. ඔවුන්ගෙන් බොහෝ දෙනා එය වැඩ සටහන අධීක්ෂණයට පවා ගොස් ඇත.
9. මාධ්‍ය වැඩ හුරුව අධ්‍යාපන වැඩ සටහන සඳහා දරුවන් සහභාගි කරවීමට කාර්යාල ප්‍රධානීන් විසින් ඉතා ඉහළ උනන්දුවක් හා කැමැත්තක් දක්වා ඇත. එසේම එය ඔවුන්ට ද අලුත් අත්දැකීමක් වී ඇත. මේ නිසා ලබා දිය හැකි ඉහළම පහසුකම් ලබා දෙමින් හා දරුවන්ට නිසි පුහුණුවක් ලබන්නට අවකාශ සලසා දෙමින් එය කාර්යාල ප්‍රධානීන් විසින් දක්වන ලද සහයෝගය විශිෂ්ටය.
10. මාධ්‍ය වැඩ හුරුව සඳහා මෙතෙක් යොදා ගෙන ඇති කාර්යාල ලෙස, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, තැපැල් කාර්යාල, කලාප අධ්‍යාපන කාර්යාල, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, ලංකා බැංකුව, පොලිස් ස්ථාන, ප්‍රාදේශීය සභා කාර්යාල හා සමෘද්ධි කාර්යාල දැක්විය හැකි අතර, ඔවුන් විසින් ලබා දී ඇති සහයෝගය වෙනුවෙන් බෙහෙවින් ස්තුතිවන්ත විය යුතුය.

10 වන හා 12 වන ශ්‍රේණියේ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හදාරන සිසු දරු දැරියන් සඳහා වූ මාධ්‍ය වැඩ හුරුව අධ්‍යාපන සතිය වැඩ සටහනෙහි ක්‍රියාකාරී සැලැස්ම

( 10 වන ශ්‍රේණියේ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හදාරන සිසු දරු දැරියන් ඕනෑම පිළිගත් කාර්යාලයකට ද, 12 වන ශ්‍රේණියේ තුන්වන වාරයේ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හදාරන සිසු දරු දැරියන් සමෘද්ධි, සණස, සර්වෝදය කාර්යාලයකට පමණක් මාධ්‍ය වැඩ හුරුව සඳහා අනුයුක්ත කරනු ලැබේ.)

1. පරමාර්ථය: සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හදාරන සිසු දරු දැරියන් තුළ වැඩ ලෝකය පිළිබඳ අභිමානයක් ඇති කිරීම, වැඩ ලෝකයේ සන්නිවේදන හා මාධ්‍ය කටයුතු ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ සැබෑ අත්දැකීමක් ලබා ගැනීමට අවකාශ සලසා දීම

2. අරමුණු:

(1) නව යෞවන වියේ සිටින දරු දැරියන්ට වැඩ ලෝකය පිළිබඳව හා විශේෂයෙන් එහි සන්නිවේදනය හා මාධ්‍ය කටයුතු පිළිබඳව පූර්ව අවබෝධයක් හා පූර්ව අත්දැකීමක් ලබා දීම

(2) විවිධ රැකියාවලට අදාළව සන්නිවේදනය හා මාධ්‍ය ක්‍රියාකාරකම් යොදා ගැනෙන ආකාරය පිළිබඳව ගවේෂණය කරන්නට දරුවන්ට අවකාශය සලසා දීම

(3) වැඩ ලෝකය තුළ සන්නිවේදනය හා මාධ්‍ය කටයුතු යොදා ගැනෙන ආකාරය විවිධ පැතිකඩ තුළින් වාර්තා කිරීමට දරුවන්ට අවකාශය සලසා දීම

(4) වැඩ ලෝකය තුළ දී සන්නිවේදනය හා මාධ්‍ය නිපුණතා කොතරම් වැදගත් වන්නේදැයි අත්දැකීමෙන් විඳ ගන්නට දරුවන්ට අවකාශ සලසා දීම

(5) තමා තුළ සන්නිවේදනය හා මාධ්‍ය නිපුණතා වර්ධනය කර ගත යුත්තේ කවරාකාරයෙන්දැයි විනිශ්චය කරන්නට දරුවන්ට නව අවකාශයක් සලසා දීම

(6) ශ්‍රමය පිළිබඳ අභිමානයක් ඇති කර ගනිමින්, තමන්ගේ අනාගත ජීවිකා වෘත්තිය සැලසුම් කර ගැනීමට පෙර සූදානම්වීමට දරුවන්ට නව අවකාශයක් සලසා දීම

3. ක්‍රියාවලියේ ස්වභාවය: 10 වන ශ්‍රේණියේ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හදාරන සිසු දරු දැරියන් එම කාර්යාලයේ දෛනික කාර්යයන්ට සම්බන්ධවෙමින් වැඩ අත්දැකීමක් ලබාගැනිම හා 12 වන ශ්‍රේණියේ (තුන්වන වාරයේ) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හදාරන දරු දැරියන් පාසල ආසන්නයේ ඇති සංවර්ධන ව්‍යාපෘතියකට සතියක කාලයකට අනුයුක්ත කිරීම හා එම කාලය තුළ එම දරු දැරියන් එම ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු සඳහා සන්නිවේදනය හා මාධ්‍ය උපයෝගී කර ගන්නා ආකාරය පිළිබඳව සැබෑ අත්දැකීමක් ලබා ගැනීම

4. අනුගමනය කළ යුතු පියවර:

(1) පාසලේ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය උගන්වන ගුරු භවතා විසින් විදුහල්පතිතුමා/තුමිය සමග මූලික සාකච්ඡාවක් පවත්වා මූලික කරුණු පිළිබඳව එකඟත්වයකට පැමිණීම හා කමිටුවක් පිහිටුවා ගැනීම

(2) මූලික සැලසුම් පත්‍රයක් සකස් කර කොට්ඨාශ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ හා අදාළ පරිදි කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර ලිඛිත අනුමැතියක් ලබාගැනීම (මේ පිළිබඳ සියලු විස්තර සියලු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත යවා ඇත. )

(3) විදුහල්පතිගේ අනුමැතිය සහිතව ගුරු භවතා විසින් පාසල් ආසන්නයේ ඇති පිළිගත් කාර්යාලයක් /සංවර්ධන මධ්‍යස්ථානයක් වැඩ හුරුව ස්ථානය වශයෙන් තෝරා ගැනීම

(4) විදුහල්පති විසින් අදාළ කාර්යාලයේ ප්‍රධානියා වෙත ලිඛිතව ලිපියක් යවා ඒ සඳහා පිළිතුරු ලබා ගැනීම මගින් මෙම කාර්යයට එම කාර්යාලය /සංවර්ධන ව්‍යාපෘතිය හා විදුහල අතර නිශ්චිත හා ලිඛිත එකඟත්වයක් ලබාගැනීම

(5) මූලික සාකච්ඡාවක් පැවැත්වීම: මේ සඳහා අදාළ කාර්යාලයේ / සංවර්ධන ව්‍යාපෘතියේ නිලධාරි නියෝජිතයකු / විදුහල්පති /කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයේ නියෝජිතයකු / වැඩ සටහනට සහභාගිවීමට කැමැත්ත පළ කළ 10 හා 12 ශ්‍රේණිවල දරුවන්ගේ දෙමාපියන් / විෂය භාර ගුරු භවතා / සහය වන ගුරු භවතුන් / හා වෙනත් අය අභිමතය පරිදි සහභාගි කරවා ගත හැකිය.

(6)